# දේශීය ශාන්තිකර්ම හා බැඳි සැරසිලි කලාව සහ වාස්තු ශාස්ත්‍රය අතර ඇති සබඳතාවය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

**පෙරේරා ඒ.ඒ.ජී.ඒ.**[1]

දේශීය ශාන්තිකර්ම යනු ප්‍රධාන වශයෙන්ම නීරෝගී බව සහ සෞභාග්‍ය අරමුණු කරගනිමින් සිදුකරනු ලබන සාම්ප්‍රදායික අභිචාරමය අංගයකි. ලංකාව තුළදී මෙම දේශීය ශාන්තිකර්මයන් ප්‍රදේශ පදනම් කොටගෙන බෙදා දක්වා තිබෙන නමුදු එම සියල්ලෙහිම අරමුණ යටකී පරිදි නිරෝගී බව සහ සෞභාග්‍ය අත්කර ගැනීමය. මෙම දේශීය ශාන්තිකර්ම හා බැඳි සැරසිලි කලාව යනු ප්‍රධාන වශයෙන් රංග භූමි අලංකරණය පදනම් කොටගෙන ගොඩනැගුනක් වන අතර, මේවා නිර්මාණය කිරීම සඳහා මූලික වශයෙන්ම වාස්තු ශාස්ත්‍රය භාවිතා කර ඇත. මේ ක්ෂේත්‍රයන් ද්විත්වය අතර සියුම් සබඳතාවයක් පවතින අතර, එම සබඳතාවය කුමක්ද? යන්න හඳුනාගැනීම මෙමෙ අධ්‍යයනය සිදුකිරීමේ මූලික අරමුණ වේ. මෙහිදී තොරතුරු අනාවරණය කරගැනීම සඳහා ක්ෂේත්‍ර සහ ක්ෂේත්‍ර නොවන අධ්‍යයනය යොදාගන්නා ලද අතර, ක්ෂේත්‍ර අධ්‍යයනය වැඩි වශයෙන් යොදාගන්නා ලදී. වාස්තු ශාස්ත්‍රය සහ ශාන්තිකර්ම හා බැඳි සැරසිලි කලාව යන අංග ද්විත්වය මඟින්ම අරමුණු කර ඇත්තේ ශුභ නිමිති, නක්ෂත්‍රය සහ යහපත් චාරිත්‍රවාරිත්‍ර විධි මඟින් යහපත් ජීවිතයක් ගොඩනංවා ගැනීමය. දේශීය ශාන්තිකර්ම හා බැඳි සැරසිලි අතර මූලිකම ස්ථානයක් රංග භූමියට ලැබෙන අතර, යටකී පරිදි ප්‍රදේශයන් අනුව ශාන්තිකර්මයන් වෙනස්වන ලෙසම සැරසිලිද වෙනස් ස්වරූපයෙන් නිර්මාණය කිරීම සිදුකරනුයේ වාස්තු ශාස්ත්‍රයට අනුවය. මෙහිදී සැලසුම, වින්‍යාසය, අවකාශීය සංවිධානය කිරීම යනාදී අංග කෙරෙහි සුවිශේෂී අවධානයක් යොමුකර තිබේ. උදාහරණයක් ලෙස උඩරට සම්ප්‍රදායික කොහොඹා කංකාරිය සහ උඩරට ගම්මඩුවත්, පහතරට සාම්ප්‍රදායික සබරගමු මඩු ශාන්තිකර්මයන් සඳහා පුරාණයේ සිට සම්මත නිශ්චිත දිග, පළල සහ උස භාවිතා කරනු ලැබේ. සතරවරම් දෙවිවරුන්ගෙන් පිහිට ආරක්ෂාව ලබාගැනීමේ පටන් නවග්‍රහ දෝෂ, යක්ෂ භූත දෝෂ ආදී වූ බලවේගවලින් ආරක්ෂා වීම සඳහා ද යොදාගන්නා මෙමෙ දේශීය ශාන්තිකර්ම හා ඒ ආශ්‍රිත සැරසිලි නිර්මාණ ඉදිකිරීම සඳහා භාවිතා කරනු ලබන වාස්තු ශාස්ත්‍රය යන අංග ද්විත්වයෙහිම අරමුණ ද එක හා සමාන බව පැහැදිලි වේ. වාස්තු ශිල්පියා හා ශාන්තිකර්ම ශිල්පියා මෙමෙ පූර්වෝක්ත කටයුතුවල නිර්මාපකයා වන අතර වාස්තු ශිල්පියා වාස්තු නිර්මාණයක් නියමිත වූ නියමයන්ට ඉදිකරනවා හා සමානම කාර්යභාරයක් ශාන්තිකර්ම ශිල්පියා විසින් ශාන්තිකර්මයට අවශ්‍ය භූමිය නියම කර සරසා සැරසිලි කරගැනීමේ පටන් යාගය අවසාන වන තෙක් සිදුකරනු ලැබේ. කෙසේ වුවද මේ අනුව පැහැදිලි වන්නේ දේශීය ශාන්තකර්ම හා බැඳි සැරසිලි කලාව හා වාස්තු ශාස්ත්‍රීය අංග අතර සුවිශේෂී සබඳතාවයක් පවතින බවය.

**මුඛ්‍ය පද :** වාස්තු ශාස්ත්‍රය, ශාන්තිකර්ම, රංග භූමිය, සැරසිලි, ශිල්පියා

[1]මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. anjuathukorala4@gmail.com